# 9. නිවසේ දී දෙවිඳු යදිමු

කුමාර් කමලා අම්මාත් තාත්තාත් සමග මේ සූදානම් වෙන්නේ විනෝද ගමනක් යන්නයි.





උදේ පාන්දර අවදි වී ඔවුන් මේ ගමනට සූදානම් වුණා. අම්මා කෑම හැදුවා. තාත්තා උවමනා බඩු සූදානම් කළා. කුමාර් ද නයනා ද ඔවුන්ට උදවු කළා.

ගෙදරින් පිටත් ව යැමට පෙර
ඔවුන් එක් ව දේව පියාට
කතා කළා. තාත්තා කුඩා
යැදුමකින් ඔවුන්ට මඟ
පෙන්නුවා.

ඉන් පසු අම්මාත් තාත්තාත්
සමඟ කුමාර් ද කමලා ද
සතුටින් විනෝද ගමන
පිටත් ව ගියා.

## පැවරුම්

1. පවුලේ සියලු දෙනා ම එකතු වී යාච්ඤා කරන අවස්ථා මොනවා දැයි ලියන්න.

2. පවුලේ සැමට ආශීර්වාද කරන ලෙස ඉල්ලා නිතර යාච්ඤා කිරීම පුරුද්දක් කර ගන්න.